**ශරීරය තුල සිදුවන රසායනික ක්‍රියාවලි මොනවාද?**

අප ගන්නා ආහාර වලින් ශක්තිය නිපදවා ගැනීම සඳහා අප සිරුර එම ආහාර ද්‍රව්‍ය නොයෙකුත් රසායනික ක්‍රියාවලි වලට භාජනය කරයි. එම ක්‍රියාවලි මගින් ආහාරවල ඇති පිෂ්ඨය, මේදය සහ ප්‍රෝටීන වෙනත් රසායන ද්‍රව්‍ය බවට පරිවර්තනය කරයි. මෙම රසායන ක්‍රියාවලි එන්සයිම මගින් පාලනය වේ.

අපගේ ශරීරය තුල ඇති එන්සයිම නිපදවීමට අවශ්‍ය දත්ත අපගේම දෙමවුපියන්ගෙන් අපට ලැබෙන ජාන වල අඩංගු වේ. එම ජාන වල යම් විකෘතිවීමක් සිදුවී ඇතිවිට අප ශරීරය නිපදවන එන්සයිම අකාර්යක්ෂම වේ. නැතහොත් එම එන්සයිම මුළුමනින්ම අක්‍රීය වේ. අප ශරීරයේ එවැනි එන්සයිම ඇති විට ශරීරය තුල සිදුවන රසායනික ක්‍රියා අකර්මන්‍ය වී ශරීරය තුල ඇති රසායනික සංඝටක වල අසමතුලිත බවක් ඇතිවේ. එනම් සමහර ද්‍රව්‍ය අනවශ්‍ය ලෙස වැඩිවේ. තවත් සමහර ද්‍රව්‍ය ශරීරයට අවශ්‍ය තරම් නොමැති වේ. සමහර ද්‍රව්‍ය වැඩිවීමත් අනෙක් ද්‍රව්‍ය අඩුවීමත් ශරීරයට අහිතකර වීමෙන් දරුවන් රෝගී බවට පත්වේ.

**රසායනික ක්‍රියාවල අකර්මන්‍යතා සඳහා දරුවකු පරීක්ෂා කළ යුත්තේ ඇයි?**

ලොව පුරා සෑම බිළිඳුන් 1000 කින් එක් අයකු මෙවන් රෝග වලින් පීඩා විඳී. මෙම බිළිඳුන් සාමාන්‍ය දරුවන් ලෙස උපත ලබයි. රෝග ලක්ෂණ මතුවන කාලය වන විට ස්නායු පද්ධතිය, වකුගඩු, ඇස්, කන් හා අනෙකුත් පද්ධතීන් වලට හානි සිදුවී හමාරය. ඉපදී දින කිහිපයක් ඇතුලත මෙම දරුණු අසාමාන්‍යතා පවතීද යන්න හඳුනාගත යුතු වන්නේ එබැවිනි. ඉක්මනින් හඳුනා ගැනීම හා නිසි ප්‍රතිකාර ලබාදීම මගින් මෙකී අසාමාන්‍යතා ආශ්‍රිත රෝගී තත්ත්වයන්ට, ආබාධිත තත්ත්වයන්ට මෙන්ම මරණයට පවා ඇති අවදානම හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිකාර කළ හැකිය. එබැවින් බටහිර දියුණු රටවල උපදින සියළුම දරුවන් රසායන ක්‍රියාවලි අකර්මන්‍යතා සඳහා පරීක්ෂා කරනු ලැබේ. එම පරීක්ෂණ දැන් අප රටේත් ඇත.

**මාගේ බිළිඳා පරීක්ෂා කරන්නේ කෙසේද?**

ඔබගේ බිළිඳාගේ යටි පතුලෙන් රුධිර බිඳු කිහිපයක් ලබා ගනු ලැබේ.



බිළිඳා ඉපදී පැය 24 ක් ගතවූ පසු රුධිර සාම්පලය ලබා ගැනීම සාමාන්‍ය නිර්දේශයයි. එයට හේතුව නම් ඒ වනවිට බිළිඳාට ලබා දුන් මව්කිරි නිසා ඔහුගේ/ඇයගේ සියළුම රසායනික ක්‍රියා ක්‍රියාත්මක වීම ආරම්භ වී තිබීමයි.

**මාගේ බිළිඳාගේ පරීක්ෂණ වාර්තා හොඳනැතිනම් කුමක් වේද?**

පූර්ව පරීක්ෂණ සහ රෝගය තහවුරු කරන පරීක්ෂණ යනුවෙන් පරීක්ෂණ වර්ග කොටස් දෙකකි.

මුල් අවස්ථාවේදී සිදුකරනු ලබන පූර්ව පරීක්ෂණ රෝගය පිළිබඳව දළ අදහසක් පමණක් ලබා දෙන අතර එය රෝගය තහවුරු කරන පරීක්ෂණ මගින් තහවුරු කරගත යුතුය. ඇතැම් අවස්ථාවලදී පූර්ව පරීක්ෂණ රෝගය ඇති බවට වාර්තා කලද තව දුරටත් පරීක්ෂා කිරීමේදී රෝගයක් නොමැති බවට තහවුරු විය හැකිය. නමුත් රෝගය තහවුරු කරන පරීක්ෂණ මගින් ඔබේ බිළිඳාට රෝගය ඇතැයි නිශ්චය කලේ නම් ඒ සඳහා ප්‍රතිකාර කිරීම අත්‍යවශ්‍ය වේ.

අප කරන පරීක්ෂාව පූර්ව පරීක්ෂණයකි. එමනිසා එම පරීක්ෂණ වාර්තා හොඳ නැති වුවද කලබල වීමට හේතුවක් නොමැත. රෝගය ඇතිදැයි තවත් පරීක්ෂණ මගින් තහවුරු කරගත හැක.

**මාගේ බිළිඳාට මෙවන් රෝගයක් ඇතිනම් එය සුවකර ගත හැකිද?**

වර්තමානයේ ඇති ප්‍රතිකාර ක්‍රම වලට අනුව බොහෝ රසායනික ක්‍රියාවල අකර්මන්‍යතා නිසා ඇතිවන රෝග සුව කිරීමට නොහැකිය. මුල් අවධියේදීම රෝගය හඳුනා ගැනීම හා ප්‍රතිකාර කිරීමේ අරමුණ වන්නේ රසායනික ද්‍රව්‍ය අඩුවීම හෝ වැඩිවීම හෝ නිසා සිදුවන හානිය වළක්වා ගැනීමයි. සිදු කරන ප්‍රතිකාර අතර විශේෂ ආහාර ක්‍රම, බෙහෙත් සහ අනෙකුත් ප්‍රතිකාර ක්‍රම වේ.

**බිළිඳාට මෙවැනි රෝග සෑදෙන්නේ කෙසේද?**

අප සියළු දෙනාටම සෑම ජානයකම පිටපත් දෙකක් බැගින් ඇත. ඉන් එක් පිටපතක් මවගෙන්ද අනෙක පියාගෙන්ද උරුම වේ. මවගේ හා පියාගෙන් යන දෙදෙනාගෙන්ම උරුම වන එන්සයිම සෑදීම සඳහා අවශ්‍ය වන ජානයක් විකෘතිතාවයකට ලක්වී තිබීම මෙම රෝග සෑදීම සඳහා හේතුවයි. මෙම රෝග ඇති දරුවන්ගේ දෙමාපියන් බොහෝ විට සාමාන්‍ය අය වෙති. ඔවුන්ගේ ඇති ජාන පිටපත් දෙකෙන් එක් පිටපතක් සාමාන්‍ය අතර අනෙක විකෘතිවී ඇත. එම නිසා ඔවුන් රෝග වාහකයෝ ලෙස සලකති.

**මාගේ අනෙක් දරුවනුත් මෙම රෝගයට ගොදුරු වේද?**

සාමාන්‍යයෙන් රසායනික ක්‍රියාවලි අකර්මන්‍ය වීමෙන් ඇතිවන රෝගයකින් පෙලෙන දරුවකු නැවත ලැබීමේ හැකියාව 25% ක් පමණ වේ. එහෙත් මෙම ප්‍රශ්ණය සඳහා නියම පිළිතුර ඔබගේ දරුවාගේ රෝග නිර්ණය මත රඳා පවතී. සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකුට ඔබගේ පවුලේ සෞඛ්‍ය ඉතිහාසය හැදෑරීමෙන් අනතුරුව මෙම රෝගය නැවත ඇතිවීමේ හැකියාව පැහැදිලි කරදිය හැකිය.

**පරීක්ෂා කළ හැකි අසාමාන්‍යතා මොනවාද?**

පහත සඳහන් රෝග වලට පරීක්ෂා කිරීම සඳහා අප විසින් පහසුකම් සලසනු ලැබ ඇත.

- තයිරොයිඩ් ග්‍රන්ථි ඌණ ක්‍රියාකාරීත්වය
- අධිවෘක්ක ග්‍රන්ථි අධි ක්‍රියාකාරීත්වය
- රුධිරගත ගැලැක්ටෝස් සාන්ද්‍රණය ඉහළ යාම.
- G6PD එන්සයිමය ඌණතාවය
- සිස්ටික් ෆයිබ්‍රෝසිස් තත්ත්වය
- බයොටිනිඩේස් තත්ත්වය
- මේද අම්ල ඔක්සිකරණ අසාමාන්‍යතා තත්ත්ව
- ඇමයිනෝ අම්ල අසාමාන්‍යතා තත්ත්ව
- කාබනික අම්ල අසාමාන්‍යතා තත්ත්ව


මානව ප්‍රවේණි වෛද්‍ය අංශය
වෛද්‍ය පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
කින්සි පාර
කොළඹ 8
දුරකථන: 0112-689545
ෆැක්ස්: 0112-2689979
විද්‍යුත් තැපැල - office@hgucolombo.org
www.hgucolombo.org


මානව ප්‍රවේණි වෛද්‍ය අංශය ඉන්දියාවේ NeoGen Labs ආයතනය සමග එක්ව මෙම සේවාව සපයනු ලබයි

# මගේ බිළිඳා නිරෝගීද?



## පිළිතුර රුධිර පරීක්ෂාවකින් දැනගත හැකිය

## ඔබ දත යුතු කරුණු